## පළමුවන කියැවීම

සලමොන්ගේ ප්‍රඥාව 9:13-18

සලමොන්ගේ ප්‍රඥාව නමැති පොතෙන් ගත් පාඨයෙකි.

**" සමිඳුන්ගේ කැමැත්ත කා හට තේරුම් ගන්නට හැකි ද?"**

දේව අදහස් කුමන මිනිසකුට දත හැකි ද? සමිඳුන්ගේ කැමැත්ත කා හට දැනගන්නට හැකි ද? මැරෙනසුලු මිනිසාගේ කල්පනා අස්ථිර ය; අපේ අදහස් චපල ය. මන්ද, මැරෙනසුලු කය ආධ්‍යාත්මයට පීඩා කරයි. පසින් සෑදුණු මේ ගත, සිතුවිලි ගහණ වූ බුද්ධියට බරකි. මිහි පිට ඇති දේ ක්‍රියා කරවීම දුෂ්කර ය. අපට ලබාගත හැකි දේ දැනගැනීම දුෂ්කර ය. එසේ තිබිය දී සගලොව ඇති දේ සොයාගත හැක්කේ කා හට ද? ඔබ ප්‍රඥාව නුදුන් සේක් නම්, ඔබ ඉහළින් ශුද්ධාත්මානුභාවය නොඑවූ සේක් නම් ඔබේ අදහස් ගැන කා හට ඉගෙනගත හැකි වේ ද? මෙලෙස ප්‍රඥාව මගින් මිහි පිට අයගේ ගමන් මාර්ගය කෙළින් කරනු ලැබ ඔබට ප්‍රසන්න දේ ඔවුන්ට උගන්වා ගැළවීම ලබා දී ඇත.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 90:3-6, 12-14, 17

පිළිතුර: සමිඳුනි, ඔබ අප වාසස්ථානය වන සේක.

ගීය: ඔබ මිනිසා යළි දූවිල්ලට හරවන සේක, "මිනිසුනි, දූවිල්ලට හැරේවා" කියා ඔබ වදාරන සේක. ඔබ ඇස් ඉදිරියෙහි වසර දහසක් ගෙවී ගිය ඊයේ දවස වැනි ය, රැයේ එක යාමයක් වැනි ය.

සැඩ පහරකින් මෙන් ඔබ මිනිසුන් ගෙන යන සේක; ඔව්හු සිහිනයක් මෙන් පහ වී යති; උදේ දළු දැමූ තණ පත හා සමාන වන්නෝ ය. උදේ ඒවා සරුසාර ලෙස වැඩෙන්නේ ය, සවස් කල පර වී වියළී යන්නේ ය.

දිවි පෙවෙත කොතරම් ලුහුඬු ද කියා වටහා දුන මැනව. මෙය මෙනෙහි කරන පිණිස නැණවත් සිතක් අපට දුන මැනව. සමිඳුනි, මෙපමණ දිගු කලක් ඈත් වී නොසිට ඔබ අප වෙත පෙරළා පැමිණිය මැනව. ඔබේ දාසයන්ට අනුකම්පා කළ මැනව.

උදයෙන් උදය ඔබේ ප්‍රේමයෙන් පිරී අපි අවදි වමු. දිවිය පුරා තුටු පහටු සිතින් අපි ගී ගයමු. අප දෙවිඳුන්ගේ කරුණාව අප කෙරෙහි බැබළේ වා! අපේ වැඩ කටයුතු ඔබ මගින් ජයෙන් ජයට ම පැමිණේ වා!.

## දෙවන කියැවීම

පිලමොන් 1:9-10, 12-17

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් පිලමොන්ට ලියන ලද හසුනෙන් ගත් කොටසකි.

**"දාසයෙකු නොව, දාසකම ඉක්ම වූ ප්‍රේමණීය සහෝදරයෙකු මෙන් ඔහුව පිළිගන්න."**

පාවුලු නම් මම, ඉතා ආදරයෙන් ඔබගෙන් ඉල්ලීමක් කරමි. ඒ ඉල්ලීම නම්, මා හිරගෙදර සිටිය දී මාගේ දරුකමට පත් වූ ඔනේසිමස් ගැන ය. වරක් ඔහු ඔබට නිෂ්ප්‍රයෝජන ව සිටි නමුත්, දැන් ඔහු ඔබටත් මටත් ප්‍රයෝජනවත් වී සිටියි. මාගේ හදවත වැනි ඔහු ඔබ වෙත ආපසු එවමි. සුබ අස්න නිසා මා හිර අඩස්සියේ සිටිය දී ඔබ වෙනුවෙන් මට උපස්ථාන කරන පිණිස ඔහු මා ළඟ නවතාගැනීමට

මම කැමැත්තෙමි. එහෙත් ඔබේ අනුමැතිය නැති ව කිසිත් කරන්නට මම කැමැති නොවෙමි. මන්ද, ඔබේ උපකාරය බල කිරීමෙන් නොව, සිය කැමැත්තෙන් ම දෙන දෙයක් විය යුතු යි. සමහර විට ඔනේසිමස් ඔබෙන් ටික කලකට වෙන් වූයේ, නැවත ඔහු ඔබට සදහට ම අයිති වන පිණිස විය හැකි ය. එහෙත් මෙතැන් පටන් ඔහු දාසයෙකු නොව, දාසකම ඉක්ම වූ ප්‍රේමණීය සහෝදරයෙකි. මට ඔහු එසේ නම් මිනිසෙකු වශයෙන් පමනක් නොව, කිතුණුවකු වශයෙන් ඔහු ඊටත් වඩා ඔබට එසේ විය යුතු නොවේ ද? ඔබ මා ගැන ඇදහිල්ල පිළිබඳ සහකාරයෙකු හැටියට සිතන්නෙහි නම්, ඔබ මා පිළිගන්නාක් මෙන් ඔනේසිමස් ද පිළිගන්න.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සාධුකාරය** ජුවාම් 15:15

ආලේලූයා! ආලේලූයා!
"ඔබ මාගේ මිතුරෝ ය. මන්ද, මාගේ පියාණන් වහන්සේගෙන් මා ඇසූ සියල්ලම ඔබට දන්වා වදාළ බැවිනි ය"යි සමිඳාණෝ වදාරණ සේක.
ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** ලූක් 14:25-33

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"තමන් සතු සියල්ල අත් නොහරින කිසිවෙකුට මාගේ ගෝලයකු වන්නට බැරි ය."**

තවද මහා ජනකායක් ජේසුස් වහන්සේ සමඟ ගමන් ගත්හ. උන් වහන්සේ හැරී ඔවුන්ට මෙසේ වදාළ සේක: "මා වෙත එන තැනැත්තේ මට වඩා තම පියාට ද මවට ද භාර්යාවට ද දරුවන්ට ද සහෝදරයන්ට ද සහෝදරියන්ට ද තමාගේ ම ජීවිතයට වුව ද ප්‍රේම කරන්නේ නම්, ඔහුට මාගේ ගෝලයකු විය නොහැකි ය. කුරුසිය දරා ගෙන, මා අනුව නොඑන තැනැත්තාට මාගේ ගෝලයකු විය නොහැකි ය. ඔබ අතුරෙන් යමෙක් මුර අටල්ලක් ගොඩනැඟීමට අදහස් කරයි නම්, එය නිම කරලීමට කොතරම් වියහියදම් ඇද්ද යි පළමුකොට හිඳ ගණන් නො බලන්නේ ද? එසේ නොකළොත්, අත්තිවාරම දමා ඒ අටල්ල නිමකරන්නට නොහැකි වූ විට, එය දකින සියල්ලන්, 'මේ මිනිසා ගොඩනගන්නට පටන්ගත් නමුත් නිම කරන්නට ඔහුට බැරි වී යයි කියා සරදම් කරනු ඇත. තවද, තමන්ට විරුද්ධ ව විසි දහසක් රැගෙන යුද පිණිස එන රජෙකුට මුහුණ පෑමට දස දහසක් රැගෙන යා හැකි ද යි පළමුකොට හිඳ නොවිමසන කිසි යම් රජෙක් ඇද් ද? එසේ කළ නොහැකි නම්, ඔහු ඒ රජ දුර සිටිය දී ම, රාජ දූතයන් යවා, සාම ගිවිසුමක් ඉල්ලා සිටිනු ඇත. එමෙන් ම ඔබ අතුරෙන් තමන් සතු සියල්ල අත් නොහරින කිසිවෙකුට මාගේ ගෝලයකු වන්නට බැරි ය.".

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.